# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 45 දරන
# විශේෂිත තැන්පතු සහතික
# (බදු සහ වෙනත් සහන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 6 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 දෙසැම්බර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 44/90

**තමා සන්තකයේ යම් විශේෂිත තැන්පත් සහතිකයක් ඇති යම් තැනැත්තකුට බදු සහන සැලසීම සඳහා ද එවැනි සහතික මිලට ගන්නා ලද්දේ යම් ලාභවලින් හෝ ආදායම්වලින් ද ඒ ලාභ හෝ ආදායම් නියෝජනය කෙරෙන මුදල් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විශේෂ ගිණුම්වල තැන්පත් කිරීමට හැකි කරවනු සඳහා ද ඒ විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් මත බද්දක් පනවා අයකර ගැනීම සඳහා ද ඒ ගිණුම්වල මුදල් තැන්පත් කරනු ලබන තැනැත්තන්, ඒ ලාභ හෝ ආදායම්වලට අදාළ වැරදිවලට සඳහා නඩු පවරනු ලැබීමේ මගහැරීමෙන් නිදහස් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) මේ පනත, යම් තැනැත්තකු සන්තකයේ යම් විශේෂිත තැන්පතු සහතිකයක් තිබෙන සහ— මේ පනත අදාළ වන තැනැත්තන්.

(අ) ඔහුගේ අදාළ සම්පූර්ණ ලාභවලින් හෝ ආදායමෙන් හෝ ඒ ලාභවල හෝ ආදායමේ යම් කොටසකින් ඒ තැන්පතු සහතිකය මිලට ගෙන තිබෙන බව කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් සොයා ගනු ලැබ ඇති අවස්ථාවක,

හෝ

(ආ) 1990 මාර්තු මස 31 වන දින හෝ ඊට පූර්ව ඒ තැනැත්තාට ලැබුණා වූ හෝ උපචිත වූ ලාභ හෝ ආදායම් හෝ පිරිවැටුම සම්බන්ධයෙන් ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීම පිණිස තත්කාලයේ අදාළ වන නීතියේ විධිවිධාන යටතේ ගෙවිය යුතු යම් බද්දක් හෝ 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පිළිබඳව කරනු ලැබූයි කියනු ලබන හෝ සැකකරනු ලබන පැහැරහැරීමක් පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් ආරම්භ කිරීමට පෙර, ඔහු විසින් ඒ තැන්පතු සහතික මිලට ගන්නා ලද්දේ ඔහුගේ සම්පූර්ණ අදාළ ලාභ සහ ආදායම හෝ එහි යම් කොටසක් නියෝජනය කෙරෙන මුදල්වලින් බව කොමසාරිස් ජනරාල්වරයාට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට සිය කැමැත්තෙන්ම අනාවරණය කළ අවස්ථාවක

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සෑම තැනැත්තකුම මේ පනතේ මෙහි මින්මතු "මේ පනත අදාළ වන තැනැත්තා" යනුවෙන් ද ඒ උපවගන්තියේ සඳහන් කරන ලද සෑම විශේෂිත තැන්පතු සහතිකයක් ම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන විශේෂිත තැන්පතු සහතිකය" යනුවෙන් ද සඳහන් කරනු ලැබිය යුතු ය.

මේ පනත අදාළ වන තැනැත්තන් විසින් බැංකුවේ විශේෂ ගිණුම්වල මුදල් තැන්පත් කළ හැකි බව.

3. (1) මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින්, මේ පනත අදාළ වන යම් විශේෂිත තැන්පතු සහතිකයක් බැංකුවට විකුණනු ලැබිය හැකි අතර, ඒ විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල බැංකුවෙහි තත් කාර්ය සඳහා ඔහු විසින් විවෘත කිරීමට යෙදෙන විශේෂ ගිණුමක ඔහුගේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) ඒ තැන්පතු සහතිකය මේ පනත අදාළ වන තැන්පතු සහතිකයක් බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කරන්නේ නම්, මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් බැංකුවට විකිණීමට පිරිනමන මේ පනත අදාළ වන යම් විශේෂිත තැන්පතු සහතිකයක් බැංකුව විසින් නිගමනය කරනු ලබන මිලකට මිලට ගැනීම බැංකුවේ කාර්ය වන්නේය.

බැංකුවේ විශේෂ ගිණුමක තැන්පත් කරන මුදල් ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන බද්දක් අයකිරීම.

4. (1) 3 වන වගන්තියේ විධිවිධාන අනුව, යම් තැන්පතුවක් කරන සෑම තැනැත්තකු විසින් ම—

(අ) මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් බැංකුව වෙත ප්‍රකාශයක් කළ යුතුය ;

(ආ) 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැංකුවට විකිණීමට යෙදී ඇති මේ පනත අදාළ වන විශේෂිත තැන්පතු සහතිකයේ ප්‍රකාශන අගයෙන් සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයක බද්දක් කොමසාරිස් ජනරාල් වරයාට ගෙවීමට යටත් විය යුතුය ; තවද

(ඇ) ඒ විශේෂිත තැන්පතු සහතිකය සම්බන්ධයෙන් 1982 අංක 43 දරන මුද්දර බදු පනතේ විධිවිධාන යටතේ ඔහු විසින් ගෙවන ලද යම් මුද්දර බද්දක මුදල (ආ) ඡේදය යටතේ ගෙවනු ලබන බද්දෙන් අඩු කරගැනීමට අයිතිය ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අඩුකරගත හැකි යම් මුදලක් අඩු කිරීමෙන් පසු ඒ වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ තැනැත්තා විසින්, 3 වන වගන්තියේ සඳහන් කරන ලද විශේෂ ගිණුම විවෘත කිරීමේ දිනයේ සිට දින දහහතරක් ඇතුළත දී, ඒ ගිනුමේ ඔහුගේ බැරට ඇති මුදල්වලින්, බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතුය.

(3) 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල්වලින් (2) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට බද්ද ගෙවීම, ඒ තැනැත්තා විසින් බලය දුන් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

5. වෙනත් ලිඛිත නීතියක, කුමක් සඳහන් වුවද, 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක මුදලක් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් ඒ විශේෂ ගිණුම් විවෘත කරන ලද දිනයේ සිට ගණන් ගනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් අවසාන වීමට ප්‍රථමයෙන් 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවීමෙන් පසු ඒ විශේෂ ගිණුමේ ඔහුගේ බැරට පවතින ඉතිරි සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක් ආපසු ගැනීමට බැංකුව විසින් අවසර නොදිය යුතුය : විශේෂ ගිණුම්වල තැන්පත් කරන මුදල් ආපසු ගැනීම පිළිබඳ සීමාකිරීම.

එසේ වුවද, ඒ තැනැත්තාට—

(අ) බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ඉහත කී අවුරුදු දෙකක කාලසීමාව අවසන් වීමට ප්‍රථම, ඒ ශේෂ මුදලට එකතුවන මුළු පොලිය හෝ එහි යම් කොටසක් ආපසු ගැනීමට අවසර දිය යුතුය ;

(ආ) බැංකුව වෙත යවනු ලබන ලිඛිත සංදේශයක් මගින්, 1989 මාර්තු 31 වන දිනෙන් හෝ එදිනට ප්‍රථමයෙන් වූ යම් කාලයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවා ඇති යම් බද්දක් හෝ ඒ මත වූ යම් දණ්ඩනයක් ඉවූ කිරීම සඳහා ඒ මුළු ශේෂ මුදල හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කිරීමට ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

6. 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවීමෙන් පසු 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට පවතින ශේෂ මුදල මත, ඉතිරි කිරීමේ ගිණුම්වල බැරට ඇති මුදල් සඳහා බැංකුව විසින් ගෙවනු ලබන තත්කාලයේ බලපවත්නා පොලී අනුප්‍රමාණයට අනුව පොලිය ගෙවිය යුතු ය. විශේෂ ගිණුම්වල තැන්පත් කරන මුදල් සඳහා පොලිය.

7. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරනු ලැබ ඇති මුදල් මත, 5 වන වගන්තියේ සඳහන් කරන ලද අවුරුදු දෙකක කාලසීමාව තුළ උපචිත වන්නා වූ පොලිය ආදායම් බද්දෙන් නිදහස් කළ යුතු ය. විශේෂ ගිණුම්වල තැන්පත් කරන මුදල් මත ලැබෙන පොලිය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවූ ලෙස සලකනු ලබන තැනැත්තකු ඇතැම් බදු වලින් හා නඩු පවරනු ලැබීමේ වගකීමෙන් නිදහස් කිරීම.

8. 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවූ ලෙස සලකනු ලබන මේ පනත අදාළ වන යම් තැනැත්තකු—

(අ) (i) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි යම් විශේෂ ගිණුමක ඔහු විසින් තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදල් නියෝජනය කෙරෙන ඔහුගේ අදාළ ලාභවල හෝ ආදායමේ කොටස වෙනුවෙන් වූ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ පැනවීමට අදාළ වන තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දක් හෝ ආදායම් බද්ද මත අධිභාරයක් ; හෝ

(ii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි ඒ තැනැත්තා විසින් එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදලෙන් නියෝජනය වන ඔහුගේ අදාළ ලාභයේ හෝ ආදායමේ කොටස උපයෝගී කරගනු ලැබුවේ ඔහුගේ ශුද්ධ ධනයෙන් යම් කොටසක් අත්කර ගැනීම සඳහාද ඒ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් වූ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වන තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ධන බද්දක් හෝ ධන බද්ධ මත අධිභාරයක් ; හෝ

(iii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි ඒ තැනැත්තා විසින් එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදල්වලින් නියෝජනය කෙරෙන ඔහුගේ අදාළ ලාභවල හෝ ආදායමේ ඒ කොටස උද්ගතවූයේ හෝ ව්‍යුත්පන්න වූයේ කවර පිරිවැටුමකින්ද ඒ පිරිවැටුම් ඒ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක්

ගෙවීමට යටත් නොවිය යුතුය ; නැතහොත්

(ආ) (i) (අ) (i) ඡේදයේ සඳහන් කරන ලද ඔහුගේ අදාළ ලාභවල සහ ආදායමේ ඒ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් නැතහොත් (අ) (ii) ඡේදයේ සඳහන් කරන ලද ඔහුගේ ශුද්ධ ධනයේ ඒ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයේ අදාළ වන නීතිය යටතේ වූ ; හෝ

(ii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අව සන් වන යම් කාර්තුවකට අදාළව, (අ) (iii) ඡේදයේ සඳහන් කරන ලද පිරිවැටුමේ ඒ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ වූ හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ වූ

යම් වරදකට නඩු පවරනු ලැබීමට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය.

මේ පනතේ කලින් සඳහන් කළ විධිවිධාන කලින් කරන ලද යම් තක්සේරුවක් ප්‍රතිශෝධනය කිරීමට බලය දීමක් ලෙස තේරුම් නොගත යුතු බව.

9. මේ පනතේ කලින් සඳහන් කළ විධිවිධාන කිසිවකින්, එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මක හා තීරණාත්මකව ඇති—

(අ) (i) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වන්නා වූ තත් කාලයේ පවත්නා නීතියේ විධිවිධාන යටතේ ; හෝ

(ii) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ විධිවිධාන යටතේ

කරන ලද යම් තක්සේරුවක් ; හෝ

(ආ) වෙනත් යම් කරුණක්,

ප්‍රතිශෝධනය කිරීමට බලය දී ඇති ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

රහස්‍යතාවය පවත්වා ගැනීම.

10. (1) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ සෑම නිලධරයෙකු හෝ සේවානියුක්තයෙකුම විසින් මේ පනත ක්‍රියාත්මක කිරීමේදී තමාට දැනගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතු ය :

එසේ වුවද, බැංකුවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් මේ පනතේ විධිවිධාන ඉටු කිරීමේ කාර්යය සඳහා, 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමකට අදාළ වූ පහත දැක්වෙන විස්තර කොමසාරිස් ජනරාල්වරයාට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට සංදේශනය කරනු ලැබිය හැකිය :—

(අ) ගිණුම හිමිකරුගේ නම සහ ආදායම් බදු ලිපිගොනු අංකය ;

(ආ) ව්‍යාපාරයක් ඇත්නම් ඒ ව්‍යාපාරයේ නාමය සහ ආදායම් බදු ලිපිගොනු අංකය ;

(ඇ) මුදල් තැන්පත් කළ හෝ ආපසු ගත් දිනය ;

(ඈ) තැන්පත් කළ හෝ ආපසු ගත් මුදල ;

(ඉ) ඒ විශේෂ ගිණුමට අදාළව, 4 (1) (අ) වගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශයක සඳහන් කරන ලද පරිදි එවැනි වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වූ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"බැංකුව" යන්නෙන් 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකුව පනතින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා", "ලාභ", "ආදායම්", "ධනය" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වල 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා පිළිවෙලින් දී ඇති අර්ථයම ඇත්තේ ය;

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් ඇතුලත් වේ.

"අදාළ ලාභ හෝ ආදායම්" යන්නෙන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට—

(අ) ඔහුට ව්‍යුත්පන්න වූ හෝ 1980 මාර්තු 31 වන දිනට හෝ ඊට ප්‍රථම ඔහුගේ යහපත පිණිස උද්ගත වූ හෝ උපචිත වූ යම් ලාභ හෝ ආදායම් ද;

(ආ) ඒ වෙනුවෙන් ඔහු විසින් වාර්තාවක් සපයා නැත්තා වූ හෝ ආදායම් බද්ද පැනවීමට අදාළ වූ තත්කාලයේ පවත්නා නීතිය යටතේ ඔහු විසින් සපයන ලද යම් වාර්තාවක එළිදරව් කර නොමැත්තා වූ යම් ලාභ හෝ ආදායම් ද;

(ඇ) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ පැනවීමට අදාළ වූ තත්කාලයේ පවතින නීතිය යටතේ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ අය කරගත යුතු වන්නේ කවර ලාභ හෝ ආදායම් මත ද එවැනි යම් ලාභ හෝ ආදායම් ද

අදහස් වේ;

"විශේෂිත තැන්පතු සහතිකය" යන්නෙන්—

(අ) 1989 අංක 9 දරන භාණ්ඩාගාර තැන්පතු සහතික පනත යටතේ ; සහ

(ආ) 1990 ජූනි 20 වන දින හෝ ඊට පසුව, එහෙත් 1991 ජනවාරි 1 වන දිනට පෙරාතුව

නිකුත් කරන ලද යම් තැන්පතු සහතිකයක් අදහස් වේ.

"ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වූ තත් කාලයේ පවතින නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාරය පනත, 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාරය පනත සහ 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාරය පනත අදහස් වේ ;

"ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වූ තත්කාලයේ පවතින නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 25 දරන ධන බදු අධිභාරය පනත සහ 1989 අංක 8 දරන ධන බදු අධිභාරය පනත අදහස් වේ.

**12.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පවත්වන බව.

## උපලේඛනය

4(1) අ වගන්තිය.

1990 අංක  දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත 4(1)(අ) වගන්තිය යටතේ ප්‍රකාශය.

ආදායම් බදු ලිපිගොනු අංකය ඇතොත් :.................

විශේෂ ගිණුම් අංකය :.................

ඇත් නම් ව්‍යාපාරයේ නාමය :.................

දිනය :.................

.....................පදිංචි.....................

.........................මයා/මිය/මෙනවිය/වන මම/අපි—

මබගෙන් පහත දැක්වෙන පරිදි ඉල්ලා සිටිමි/සිටිමු :—

(1) (අ) .....................ප්‍රකාර,.....................

පදිංචි..........................................ගේ නමින් වූ විශේෂ ගිණුමක තැන්පත් කිරීම සඳහා රුපියල් .................. (රු.......)

මුදලක් භාරගන්නා ලෙස :

(ආ) මෙම මුදල මත අයවිය යුතු රුපියල්...........(රු......) ක් වූ බද්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත කෙළින්ම ප්‍රේෂණය කරන ලෙස ;

(ඇ) ඒ ගිණුමේ ශේෂය පහත දැක්වෙන පරිදි දැරීමට—

| | |
|---|---|
| තැන්පත් කළ මුළු මුදල | රු.................. |
| අඩුකළා අඩුකර ගත යුතු 10% බද්ද | රු.................. |
| අඩුකළා ගෙවූ මුද්දර බද්ද | රු.................. |
| | රු.................. |

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විශේෂ ගිණුමේ

දැරිය යුතු රු. ..................

(2) මෙදින සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත්වන තෙක් මෙම ශේෂ මුදලින් යම් කොටසක් ආපසු නොගැනීමට පොරොන්දු වෙමි./වෙමු.

(3) මගේ/අපගේ විශේෂ පාස් පොත ඔබ බැංකුවේ ආරක්ෂක භාරකාරත්වයේ තබාගැනීමට එකඟ වෙමි./වෙමු.

(4) ඔබ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුම්වලට අදාළ තත්කාලයේ පවත්නා සහ කලින් කල ක්‍රියාත්මක විය හැකි රීතිවලින් බැඳී සිටීමට ද තවදුරටත් එකඟ වෙමි./වෙමු.

(5) මම/අපි විසින් ඒ සඳහා ලියවිල්ලකින් ඉල්ලීමක් කිරීමෙන් පසු මෙම ශේෂ මුදලේ මුළු මුදල හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඔබට මෙයින් බලය පවරමි./පවරමු.

......................,
තැන්පත්කරුගේ අත්සන.

මා ඉදිරියේ අත්සන් කරන ලදී.

ශාඛා කළමනාකරුගේ අත්සන.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල් සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.